# සෙන්පති නාමන්

– 26th Story–



188Page

පොතේ ගුරා ඉශ්රායෙල් දේශයට අසල්වාසී රටක් වූ ආරාම් නම් දේශයේ ගෞරවාන්විත සෙන්පතියෙක් සිටියා. ඔහුගේ නම නාමන්. ආරාම් රජු නාමන් කෙරේ විශේෂ ප්‍රසාදයකින් සිටි අතර නාමන් කුෂ්ඨ රෝගයෙන් පෙළුණේය. කුෂ්ඨ රෝගය වනාහි ඉතා භයානක රෝගයක් වන අතර, හැඟීම් දැනීම් නැති තත්වයකට ගෙන යයි. ඔබේ ඇඟිලි, ඇඟිබැම් පාද තුවාල වුණත්, කැපුණත්, ගැලවුණත් ඒවා නොතේරෙන තත්නයකට පත්වෙයි.

..........................................................................................



189Page

පොතේ ගුරා ඉශ්රායෙල් දේශයෙන් අල්ලාගෙන ආ ඉතා කුඩා කෙල්ලෙක් නාමන්ගේ නිවසේ මෙහෙකාර සේවයේ යෙදී සිටියා.

ගැහැනු ළමයා සමාරියේ සිටින ප්‍රොපේතවරයෙක් වන එලීෂා ළඟට යන්නට මාගේ ස්වාමියා කැමති වෙයි නම් මේ කුෂ්ඨ රෝගයෙන් සුවවෙන්නට පුලුවන්. එලීෂා තමාගේ ස්වාමියා වෙනුවෙන් දෙවියන්වහන්සේට යාච්ඤා කරනවා ඇත.

පොතේ ගුරා මේ කුඩා කෙල්ල දෙවියන්වහන්සේව විශ්වාස කළා.

භාර්යාව ඒක ඇත්තක් ද ? මගේ ස්වාමියා මේ කුෂ්ඨ රෝගයෙන් සුව වෙයිද ?

ගැහැනු ළමයා ඇත්තමයි. ඔව් සහතිකයි.

පොතේ ගුරා මේ කුඩා කෙල්ල පැවසූ දෙය නාමන්ගේ භාර්යාව තම සැමියාට කීවා. නාමන් හිස වනා එය අනුමත කළා.

නාමන් හරි, මේ කුෂ්ඨය සුව වෙනවානම් මම ඉක්මනින් යන්නම්.

..........................................................................................



190Page

පොතේ ගුරා සෙන්පති නාමන් ඉශ්රායෙල් දේශයට ගියා. එලීෂාට දෙන පිණිස ඔහු බොහෝ තෑගි රැගෙන ගියා. සෙන්පති නාමන් හා ඔහුගේ මිනිසුන් එලීෂාගේ නිවසට ගොස් බැලුවත් එලීෂා පෙනෙන්න සිටියේ නෑ. නමුත් එලීෂාගේ වැඩකාරයා පිටතට පැමිණ එලීෂා කියන්න කිවූ දේ නාමන්ට කීවා.

එලීෂාගේ වැඩකාරයා ඔබ ගොස් යෝර්දානෙයි 7 වරක් නාන්න. එවිට නුඹේ මාංශය හරි ගැහී නුඹ පවිත්‍ර වන්නේ ය.

නාමන් ඔබේ ස්වාමියා කොහේද? ඔහුගේ අහංකාරය කොපමණ ද ? ආරාම්හි සෙන්පතියාව වන මාව බලන්නට ඔහුගේ සේවකයෙක් එව්ව හැටි කොහොමද ? මේ යෝර්දානට වඩා පිරිසිදු ගංගා ආරාම්වල ඕන තරම් තියෙනවා. මම මේ කුණු යෝරදානයේ ස්නානය කරන එකද ඔහුගේ කැමැත්ත. ඊට වඩා මම ආරාම්වලටම ගිහින් නා ගන්නම්.

පොතේ ගුරා සේනාපති නාමන් තද කෝපයට පත් වුණා. නමුත් ඔවුගේ සේවකයන් ඔහුට කතා කළා.

සේවකයන් සෙන්පතිතුමනි... යෝර්දාන් ගඟේ 7 වරක් ස්නානය කිරීම ඔබට ඉතාම පහසු දෙයක්. ඔබ මෙතරම් දුරක් ආවනේ. මේක කරන්න ටිකක් උත්සහ කරලා බලන්න.



191Page

**පොතේ ගුරා** සෙන්පති නාමන් තමාගේ සේවකයන්ගේ හඬට ඇහුම්කන් දී යෝර්දාන් ගඟ ළඟට ගියා.
සෙන්පති නාමන් එකායි... දෙකායි... තුනායි...
යනුවෙන් 6 වතාවක් ගංගාවේ ගිලුණත් කිසිම වෙනසක් වුණේ නෑ.
නමුත් 7 වන වතාවේ පුදුම අමුතු දෙයක් සිද්ධ වුණා.
සෙන්පති නාමන් කුෂ්ඨ රෝගයෙන් සම්පූර්ණයෙන්ම සුවය ලැබුවා.
ඔහුගේ මාංශය ද කුඩා ළමයෙකුගේ මාංශය මෙන් හරි ගැහී අලුත් සමක් ඔහුට ලැබුණා.

..............................................................................




192Page

**නාමන්** ඕහ්... ඕහ්...ම..ට පුදුමයි. ඕහ්...ම..ට පදුමයි.

**ජනතාව** මොකක්... මොනවද මේ වෙන්නේ ?

**පොතේ ගුරා** සෙන්පති නාමන් ඒ දවසේ දී දෙවියන්වහන්සේව විශ්වාස කළා.
නාමන් එලීෂා අනාගතවක්තෘතුමාටත් ගෞරවාන්විතව ස්තුති කළා.

..............................................................................



193Page

**නාමන්** ප්‍රොපේතවර එලීෂා... ගොඩාක් ස්තූතියි.
මාව සුව කළාවූ එකම දෙවියන්වහන්සේට මෙතැන් සිට මම නමස්කාර කරමින් සේවය කරනවා. මම ඔබට පොරොන්දු වෙනවා.

**පොතේ ගුරා** ඉතා මහත් ප්‍රීතියකින් සෙන්පති නාමන් නැවත තමාගේ දේශයට හැරී ගියා.

..............................................................................

**ජීවිතයට අදාල කිරීම** පුංචි වැඩකාර දැරිය හමුදා සෙන්පතියෙකුට දෙවියන්වහන්සේට සුවකරන්න පුලුවන් කියන පණිවිඩය කියන්න තරම් නිර්භීත වුණා.
හරීම පුදුම එඩිතර පුංචි ගැහැණු ළමයෙක්....
පුංචි ඔයාටත් පුලුවන් අනිත් අයට අපේ යේසුස්වහන්සේ ගැන කියන්න.
ඔයාගේ වට පිටාවේ, අසනීපව දුකට පත් වී ඉන්න, කොන්වී සිටින කාත් කවුරුත් නැති අයට යේසුගේ ආදරය ගැන කියලා දෙන්න.
දෙවියන්වහන්සේට සුවකරන්න පුලුවන් කියන පණිවිඩය කියන්න.